2019 අප්‍රේල් 09 යොමු අංකය 1819-050

දයාබර දෙමව්පියන් වෙත,

අප්‍රේල් මස 12 වැනිදා, සිකුරාදා ඩුබායි සබීල් උද්‍යානයේදී පැවැත්වෙන ශ්‍රී ලාංකික අලුත් අවුරුදු උත්සවයේ ක්‍රීඩා තරඟ වලට ඔබගේ දරු දැරියන් සහභාගී වන්නේ නම් පහත සඳහන් කරුණු ඔබගේ දැනගැනීම පිණිස සඳහන් කරමු.

- තරඟ සඳහා ලියාපදිංචි කිරීම උදෑසන 7.00 සිට, ගේට්ටු අංක 3 හි දී, ආරම්භ වේ.
- ඔබගේ දරු දැරියන් පෙර ලියාපදිංචි (Pre-Register) වී තිබුනත් ක්‍රීඩා භූමියේදී වයස අනුව නිකුත් කරන වර්ණ අත්පටි (colour wrist band) තරඟ ආරම්භයට පෙර ලබාගත යුතුය.
- කාල වේලා ඇතුව ක්‍රීඩා භූමියට පැමිණ මෙම අත් පටි ලබාගැනීමෙන් ඔබගේ දරු දැරියන් හට අදාළ තරඟ වලට සහභාගී විය හැකි වනු ඇත.
- පවතින දේශගුණය අනුව ක්‍රීඩා භූමියේ පැවතිය හැකි උෂ්ණත්වයනට මුහුණදිය හැකි වන පරිදි හිස් ආවරණ, sun cream, පානීය ජලය සහ අවශ්‍ය සුළු ආහාර රැගෙන එන්න.
- සිඟිති/යොවුන් අවුරුදු කුමරා/කුමරිය සහ විවිධ ඇඳුම් තරඟ සියල්ල උදය වරුවේ පැවැත්වෙන අතර ජයග්‍රාහකයින් හට ත්‍යාග පිරිනැමීමද උදය වරුවේ සිදුකෙරෙනු ඇත.
- දරුදැරියන් අවුරුදු උත්සවයකට සුදුසු ඇඳුමකින් සැරසී පැමිණීම උචිත වන අතර තරඟ සඳහා සහභාගී වීමට සුදුසු ඇඳීම කල හැක.

ස්තුතියි,
සංවිධායක කමිටුව

Sri Lanka Consulate General Office, No. 2, Street 322-B, Al Hudaiba, Dubai, UAE. Postal: PO Box 51528, Dubai, UAE.
TP. +971 4 3986535, Fax: +971 4 3984687, E Mail: dahampasaladubai@gmail.com, Web: http://www.dhahampasala.org